Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය 2018

විද්‍යාව

9 ශ්‍රේණිය | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. රූපයේ දැක්වෙන ක්ෂුද්‍ර ජීවීන් අයත්වන කාණ්ඩය වන්නේ,

(1) ප්‍රොටෝසෝවා ය. (2) ඇල්ගී ය.

(3) බැක්ටීරියා ය. (4) දිලීර ය.

02. ක්ෂුද්‍ර ජීවීන් සම්බන්ධයෙන් ශිෂ්‍යයෙකු ඉදිරිපත් කළ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A. වෛද්‍ය විද්‍යාවේ දී ක්ෂුද්‍ර ජීවීන් ප්‍රයෝජනවත් ලෙස යොදා ගත හැකි ය.

B. පෘථිවියේ පැවැත්ම සඳහා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය අනිවාර්යයෙන් අවශ්‍ය වේ.

C. ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ලබා ගත හැකි ප්‍රයෝජනවලට සාපේක්ෂව සිදුවන හානි අවම වේ.

මෙම ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C ය.

03. වර්තමානයේ බහුලව පවත්නා <u>අක්ෂි රෝග</u> දෙකක් වන්නේ,

(1) දුර දෘෂ්ටිකත්වය සහ අවිදුර දෘෂ්ටිකත්වය යි. (2) දුර දෘෂ්ටිකත්වය සහ ග්ලූකෝමාව යි.

(3) ග්ලූකෝමාව සහ ඇසෙහි සුද මතුවීම යි. (4) ඇසෙහි සුද මතුවීම සහ අවිදුර දෘෂ්ටිකත්වය යි.

04. අවිදුර දෘෂ්ටිකත්වයෙන් පෙළෙන අයෙකුට පිළියම් ලෙස කාච යෙදූ පසු පැහැදිලිව පෙනෙන ආකාරය නිවැරදිව දැක්වෙන රූපය කුමක් ද?



(1)



(2)



(3)



(4)

05. කැල්සියම් මූලද්‍රව්‍යයේ සංකේතය පහත ඒවායින් කවරක්ද?

(1) K (2) Ca (3) C (4) Cl

06. කාබන් ඩයොක්සයිඩ් හා සෝඩියම් ක්ලෝරයිඩ්වල රසායනික සූත්‍ර පිළිවෙලින් දැක්වූ විට,

(1) CO_2 හා NaCl ය. (2) CO හා NaCl ය. (3) CO_2 හා SOCl ය. (4) CO හා SOCl ය.

07. කැල්සියම් කාබනේට්වල ($CaCO_3$) අඩංගු මූලද්‍රව්‍ය මොනවාද?

(1) කැල්සියම් , ඔක්සිජන් සහ කාබනේට් (2) කැල්සියම් , කාබන් සහ ඔක්සිජන්

(3) කාබන් සහ ඔක්සිජන් (4) කැල්සියම් සහ කාබන්

08. බලයක් රූපිකව නිරූපණය කළ අවස්ථා දෙකක් පහත දැක්වේ.

එම බල සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) බල දෙක විශාලත්වයෙන් සමාන ය. (2) බල දෙක දිශාවෙන් සමාන ය.

(3) P බලයට වඩා Q බලය විශාලය. (4) Q බලයට වඩා P බලය විශාල ය.

09. රූපයේ දැක්වෙන බර වාහනයේ රෝද වැඩි ගණනක් යොදා ඇත්තේ,

(1) වාහනයේ බර අඩු කිරීමට ය.

(2) වාහනයේ බර වැඩි කිරීමට ය.

(3) වාහනයෙන් යෙදෙන පීඩනය අඩු කිරීමට ය.

(4) වාහනයේ ශක්තිමත් බව වැඩි කිරීමට ය.

10. දකුණු කෝෂිකාවට සම්බන්ධ රුධිර නාළයක් වන්නේ,

(1) උත්තර මහා ශිරාව යි. (2) සංස්ථානික මහා ධමනිය යි.

(3) පුප්ඵුසීය මහා ධමනිය යි. (4) පුප්ඵුසීය ශිරාව යි.

11. ශාකයක වර්ධනය යාමනය කරන රසායනික සංයෝග හඳුන්වනුයේ,

(1) ශාක හෝර්මෝන ලෙස ය. (2) වර්ධක ද්‍රව්‍ය ලෙස ය.

(3) නිශේධක ලෙස ය. (4) උත්තේජක ලෙස ය.

12. ශාකවල සිදුවන චලන ආකාර තුනක් පහත දැක්වේ.

A. පත්‍ර ස්පර්ශ කළ විට පත්‍ර හැකිළීම.

B. අඳුර වැටීමත් සමඟ පත්‍ර හැකිළීම.

C. ශාකයේ මුල පොළොව දෙසට වැඩීම.

මෙම ප්‍රකාශ වලින් නිදිකුම්බා ශාකය දක්වන සන්නමන චලන වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C ය.

13. ජෛව පරිණාමයේ දී පහත ජීවීන් අතුරින් පළමුව බිහිවූ ජීවියා විය හැක්කේ,

(1) කැරපොත්තා ය. (2) වඳුරා ය. (3) ගැඩවිලා ය. (4) බැක්ටීරියා ය.

14. රූපයේ දැක්වෙන්නේ ද්‍රව තුනක ඝනත්වය සැසඳීමට ද්‍රවමානයක් යොදා ගත් ආකාරයකි. එම ද්‍රව අතුරින් ඝනත්වය අඩුම සහ වැඩිම ද්‍රවය **<u>පිළිවෙලින්</u>** දැක්වූ විට නිවැරදි ප්‍රකාශය කුමක්ද?



(1) A හා B ය.

(2) A හා C ය.

(3) B හා C ය.

(4) C හා A ය.

15. ජලය විද්‍යුත් විච්ඡේදනයෙන් නිපදවෙන එක් ඵලයක් හඳුනා ගැනීමේදී දැල්වෙන පුළිඟු කීරක් ඇතුළු කිරීමේ දී පොප් හඬක් නැගිණි. එම වායුව කුමක් ද?

(1) ඔක්සිජන් (2) හයිඩ්‍රජන්

(3) කාබන් ඩයොක්සයිඩ් (4) මෙතේන්

16. ජෛව විවිධත්වය ලෙස හඳුන්වන්නේ,

(1) පරිසර පද්ධතිවල ඇති විවිධත්වය යි.

(2) පරිසර පද්ධතිවල සිටින ජීවීන්ගේ විවිධත්වය යි.

(3) ජීවීන්ගේ ජානවල ඇති විවිධත්වය නිසා ජීවීන් එකිනෙකාට වෙනස් වන බවයි.

(4) පරිසර විවිධත්වය , ජාන විවිධත්වය හා ජීවී විශේෂ අතර පවත්නා විවිධත්වය යන සියල්ලයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

17. කෘෂිකර්මාන්තයේ දී ඵලදායීතාව වැඩි කර ගැනීමට කළ යුතු වන්නේ,

(1) රසායනික පොහොර භාවිත කර අස්වැන්න වැඩිකර ගැනීම යි.

(2) කෘමි මර්ධනය සඳහා වඩා වේගවත් පළිබෝධනාශක හා කෘෂි රසායන භාවිත කිරීම යි.

(3) මිශ්‍ර බෝග වගාව , ශෂ්‍ය මාරු ක්‍රමය , පසු අස්වනු තාක්ෂණය හා ජෛව තාක්ෂණය යොදා ගැනීම යි.

(4) සම්ප්‍රදායක ක්‍රම වලින් මිදී නූතන යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් නව වගා ක්‍රම භාවිත කිරීම යි.

18. හරිත සංකල්පය පිළිබඳ සිසුන් ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. පෘථිවි ගෝලයේ ශාක වැස්ම වැඩි කිරීම.

B. හරිතාගාර වායු විමෝචනය අවම වීම.

C. සූර්ය බලය මගින් විදුලිය ලබා ගැනීම.

මෙම ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C ය.

19. ස්වාභාවික පරිසර පද්ධතිය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර කුමක්ද?

(1) ගංමෝය මිරිදිය ජලයෙන් යුක්තය.

(2) කලපුවක ඇත්තේ කරදිය සහිත ජලය යි.

(3) ගංගා ජලය විදුලි බලය නිපදවීමට යොදා ගනියි.

(4) මිනිසා විසින් නිර්මිත වැව් , අභ්‍යන්තර ජලාශ වේ.

20. එකිනෙක මිශ්‍ර නොවන ද්‍රව තුනක් එකම බඳුනක දමා ඇති විට,

(1) ඝනත්වයෙන් වැඩිම ජලය පහළම ස්ථරයේ වේ.

(2) ඝනත්වයෙන් අඩුම ජලය පහළම ස්ථරයේ වේ.

(3) ඝනත්වයෙන් වැඩිම ජලය ඉහළම ස්ථරයේ වේ.

(4) පළමුව බඳුනට දැමූ ජලය පහළම ස්ථරයේ පවතී.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

9 ශ්‍රේණිය **දෙවන වාර පරීක්ෂණය 2018** **විද්‍යාව - II කොටස**

- **පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සපයන්න. ඉතිරි ප්‍රශ්න 05 න් ඔබ කැමති ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමට වෙනම කඩදාසි භාවිත කරන්න.)**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් හා ඉතිරි සෑම ප්‍රශ්නයකටම ලකුණු 11 බැගින් ද හිමිවේ.**

01. රූපයේ දැක්වෙන්නේ විද්‍යුත් විච්ඡේද්‍ය සහ විද්‍යුත් අවිච්ඡේද්‍ය ද්‍රව / ද්‍රාවණ හඳුනාගැනීමට සැලසුම් කළ ක්‍රියාකාරකමක ඇටවුමකි.

<u>ක්‍රියාකාරකමට යොදාගත් ද්‍රව / ද්‍රාවණ</u>
• ලුණු ද්‍රාවණය • ආම්ලිකෘත ජලය • භූමිතෙල් • කොපර් සල්ෆේට් ද්‍රාවණය



i. භූමිතෙල් සහ ලුණු ද්‍රාවණය යොදා ගත් විට බල්බය දැල්වීම සම්බන්ධ නිරීක්ෂණ වෙන වෙනම සඳහන් කරන්න. (ල.02)

ii. ක්‍රියාකාරකමට යොදාගත් ලුණු ද්‍රාවණය , ආම්ලීකෘත ජලය , භූමිතෙල් සහ කොපර් සල්ෆේට් විද්‍යුත් විච්ඡේද්‍ය හා විද්‍යුත් අවිච්ඡේද්‍ය ලෙස වර්ග කර දක්වන්න. (ල.02)

iii. A හා B අතුරින් ධන ඉලෙක්ට්‍රෝඩය කුමක් ද? (ල.01)

iv. A හා B ඉලෙක්ට්‍රෝඩ ලෙස කාබන් හෝ මිනිරන් කුරු යොදා ගැනීම වැදගත් වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ල.02)

v. ද්‍රාවණය ලෙස කොපර් සල්ෆේට් යොදාගත් විට A හා B ඉලෙක්ට්‍රෝඩ අසල හා ද්‍රාවණයෙහි සිදුවන නිරීක්ෂණ වෙන වෙනම දක්වන්න. (ල.03)

vi. විද්‍යුත් විච්ඡේදනය මගින් නිස්සාරණය කර ගත හැකි මූලද්‍රව්‍යයක් සහ සංයෝගක් බැගින් පිළිවෙලින් ලියන්න. (ල.02)

vii. විද්‍යුත් ලෝහාලේපනය මගින් වඩාත් හොඳින් යකඩ ඇණයක් මත තඹ ආලේප කර ගත යුතු නම්,

a. ධන ඉලෙක්ට්‍රෝඩය හා ඍණ ඉලෙක්ට්‍රෝඩය ලෙස යොදා ගත යුතු ද්‍රව්‍ය පිළිවෙලින් ලියන්න. (ල.02)

b. යොදාගත හැකි විද්‍යුත් විච්ඡේද්‍ය ද්‍රාවණය කුමක්ද? (ල.01)

c. එහිදී විදුලිය සැපයීමට වඩා සුදුසු වන්නේ 1.5 V කෝෂයක් ද? 9 v කෝෂයක් ද? (ල.01) (ල. 16)

02. A මිනිස් කනෙහි ප්‍රධාන කෘත්‍ය වන්නේ ශ්‍රවණ සංවේදනය ලබා ගැනීම සහ සිරුරේ සමතුලිතතාවය රැක ගැනීම යි.

i. බාහිර ශ්‍රවණ නාළයෙන් ඇතුළුවන ශ්‍රවණය පිළිබඳ සංවේදනය ශ්‍රවණ ස්නායුවට සම්ප්‍රේෂණය කරන ව්‍යුහය කුමක්ද? (ල.01)

ii. සිරුරේ සමතුලිතතාවය රැක ගැනීමට දායකවන ශ්‍රවණ කාර්යයක් <u>ඉටු නොකරන</u> ව්‍යුහය කුමක් ද? (ල.01)

iii. යුෂ්ටේකීය නාළය මගින් කුමන මෙහෙයක් ඉටු වේ ද? (ල.01)

iv. මිනිස් කනට ශ්‍රවණය කළ හැකි ශ්‍රව්‍ය සංඛ්‍යාත පරාසය කුමක්ද? (ල.01)

v. කනෙහි ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු වැදගත් ක්‍රියා මාර්ගයක් සඳහන් කරන්න. (ල.01)

B. ජීව වායු නිෂ්පාදනය ක්ෂුද්‍ර ජීවීන් භාවිත කරන අවස්ථාවකට නිදසුනක් ලෙස දැක්විය හැකිය. කාබනික ද්‍රව්‍ය හා ජලය අඩංගු මිශ්‍රණයක කාබනික උපස්තරය මත ක්ෂුද්‍ර ජීවීන් ක්‍රියාකාරීත්වයට ලක්වේ.

i. ශ්‍රී ලංකාවේ ජීව වායු නිපදවීමට යොදා ගත හැකි කාබනික ද්‍රව්‍යයක් නම් කරන්න. (ල. 01)

ii. ජීව වායුව නිපදවීමට යොදා ගැනෙන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය කුමක්ද? (ල. 01)

iii. බල ශක්තියක් ලෙස යොදා ගත හැකි ජීව වායුවෙහි අඩංගු ප්‍රධානම වායුව නම් කරන්න. (ල. 01)

iv. ඔබ ඉහත (iii) හි පිළිතුර ලෙස සඳහන් කළ වායුවෙහි අඩංගු මූලද්‍රව්‍ය දෙක කුමක්ද? (ල. 02)

v. බල ශක්තිය ලබා ගැනීමට අමතරව ජීව වායු නිපදවීමෙන් අත්වන ප්‍රයෝජනයක් සඳහන් කරන්න. (ල. 01)

(ල. 11)

03. A. මානව හෘදය පිළිබඳව අධ්‍යයනය කිරීමට සිසුන් කණ්ඩායමක් යොදාගත් රූපසටහනක් හා රැස් කළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- කුටීර ගණන හතරකි.
- ඉහළ හා පහළ කුටීර අතර කපාටය බැගින් පිහිටා ඇත.
- මහා ධමනි දෙක ආරම්භයේ ද කපාටය බැගින් පිහිට යි.
- හෘදයට සම්බන්ධ මහා ධමනි ගණන දෙකකි.
- හෘදයේ ඉහළ කුටීරවලට රුධිර නාළ එකකට වඩා සම්බන්ධ වී පවති.



i. B , D , G හා I ලෙස නම් කර ඇති කුටීර හතර පිළිවෙලින් සඳහන් කරන්න. (ල.02)

ii. H ලෙස නම් කර ඇති කපාටය කුමක්ද? (ල.01)

iii. A , C , E හා F රුධිර නාළ හතර හඳුන්වන නම් ලියන්න. (ල.02)

iv. රූපයේ නම් කර ඇති අක්ෂර භාවිතයෙන් පහත තොරතුරු සපයන්න. (ල.02)

a. හෘදයෙන් ඉවතට රුධිරය ගෙන යන නාළයක්

b. හෘදය දෙසට රුධිරය ගෙන එන නාළයක්

v. මහා ධමනියක් ආරම්භයේ පිහිටන කපාට කෙසේ හඳුන්වනු ලබයි ද? (ල.01)

B මානව රුධිරය A, B, AB හා O ලෙස රුධිර ගණ හතරකට බෙදා දැක්විය හැකි ය. රුධිර පාරවිලයනයේ දී රුධිර ගණ ගැලපීමත් රීසස් සාධකයේ ගැලපීමත් අත්‍යවශ්‍ය වේ.

i. රුධිර ගණ ගැලපීමට අදාළව පහත සටහන පිටපත් කර සම්පූර්ණ කරන්න. (ල.02)



ii. AB (AB Rh ඍණ) රුධිර ප්‍රතිග්‍රාහකයෙකුට ලබා ගත හැකි රුධිර වර්ග සියල්ල රීසස් සාධකය සහිතව ලියන්න. (ල.01)

(ලකුණු 11)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04\. A. පෘථිවිය නිර්මාණය වීමෙන් වසර බිලියනයකට පමණ පසු පෘථිවිය මත ජීවය ආරම්භ වූ බවට මතයක් පවතී.

i. පෘථිවිය මත ජීවයේ සම්භවය පිළිබඳව පැවති මත දෙකක් සඳහන් කරන්න. (ල.02)

ii. ආරම්භක මුල්ම ජීවීන් පරිණාමයට ලක්වීමෙන් නූතන ජීවීන් බිහිවූ බව සනාථ කිරීමට යොදා ගත හැකි සාක්ෂ්‍ය දෙකක් ලියන්න. (ල.02)

iii. වසර මිලියන ගණනාවක් තිස්සේ පාරිසරික වෙනස්වීම් වලට මුහුණ දෙමින් පැවති දේහ ලක්ෂණ එසේම පවත්වා ගනිමින් නූතනයේ ද සිටින ජීවීන් කෙසේ හැඳින්විය හැකි ද? (ල.01)

B. පරිසර පද්ධති විවිධත්වය , ජීවී විශේෂ විවිධත්වය හා ජාන අතර විවිධත්වය පොදුවේ ගත් කළ ජෛව විවිධත්වය ලෙස හඳුන්වයි.

i. ජෛව විවිධත්වය ජීවීන්ට ප්‍රයෝජනවත් වන ආකාරයක් සඳහන් කරන්න. (ල.01)

ii. ජෛව විවිධත්වයට හානි සිදුවන ප්‍රධානතම ආකාර දෙක කුමක්ද? (ල.02)

iii. පරිසර පද්ධතියක පවත්නා පහත ආකාර සම්බන්ධතා ජීවී - ජීවී , ජීවී - අජීවී සහ අජීවී - අජීවී ලෙස වර්ග කර දක්වන්න. (ල.03)

a. ශාක ප්‍රභාසංශ්ලේෂණ සඳහා සූර්ය ශක්තිය යොදා ගැනීම.

b. ජලය මගින් පාංශු ඛාදනය සිදුවීම.

c. සතුන් විසින් ශාක ආහාරයට ගැනීම.

05\. A මූලද්‍රව්‍යයක තැනුම් ඒකකය පරමාණුව යි. පරමාණුවක් තුළ උප පරමාණුක අංශු වර්ග තුනක් ඇත. ශිෂ්‍යයෙක් මෙම උප පරමාණුක අංශු වර්ග තුන A, B හා C ලෙස නම් කර පහත ප්‍රකාශන ගොඩනැගීය.

A = පරමාණු ක්‍රමාංකය	උදාසීන පරමාණුවක A = B	ස්කන්ධ ක්‍රමාංකය = ... + ...

i. A, B හා C උප පරමාණුක අංශු වර්ග තුන හඳුනාගෙන නම් කරන්න. (ල.03)

ii. A, B හා C අතුරින් ස්කන්ධ ක්‍රමාංක දැක්වීමට යොදාගත යුතු අක්ෂර මොනවාද? (ල.01)

iii. ස්කන්ධය අඩුම උප පරමාණුක අංශු වර්ගය කුමක්ද? (ල.01)

iv. X නම් මූලද්‍රව්‍යයේ උප පරමාණුක අංශු වර්ග තුනම 6 බැගින් පවතී නම් X මූලද්‍රව්‍යයේ ස්කන්ධ ක්‍රමාංකය කොපමණ ද? (ල.01)

B. ශ්‍රී ලංකාවේ පවතින පරිසර පද්ධති ස්වාභාවික පරිසර පද්ධති හා කෘත්‍රිම (නිර්මිත) පරිසර පද්ධති ලෙස සරලව වර්ගීකරණය කළ හැකි ය.

i. නිර්මිත පරිසර පද්ධති වර්ග කළ හැකි ආකාර තුන කුමක්ද? (ල.03)

ii. ස්වභාවික පරිසර පද්ධති වලට අයත් නිවර්තන වැසි වනාන්තරයක් සඳහා නිදසුනක් දෙන්න. (ල.01)

iii. ජල විදුලිය නිපදවීම සඳහා යොදා ගැනෙන ස්වභාවික ජලජ පරිසර පද්ධතිය කුමක්ද? (ල.01)

(ල.11)

06\. A. සතුන් සංචරණය සඳහා විවිධ උපාංග භාවිත කරයි. එම උපාංගවලට සම්බන්ධ අස්ථි හා පේශි උපාංගය චලනය කිරීමට උපයෝගී කර ගනියි.

i. පහත ජීවීන් සංචරණය සඳහා යොදා ගන්නේ කුමක්දැයි ලියන්න. (ල.02)

a. ඇමීබා

b. ගොළුබෙල්ලා

c. ගිරවා

d. වවුලා

ii. මිනිසාගේ අතෙහි චලනය සිදුකරීමේදී A රූපයේ ආකාරයට අත ඉහළට චලනය කිරීමත්, B රූපයේ ආකාරයට අත පහළට චලනය කිරීමත්, සිදු කරයි. එම චලන සඳහා P හා Q පේශි සංකෝචනය සිදුකරයි.



පහත එක් එක් අවස්ථාවේදී සංකෝචනය කරනු ලබන පේශිය නම් කර ඇති අක්ෂරය කුමක්දැයි ලියන්න. (ල.02)

a. අත නැවීමේ දී
b. අත දිග හැරීමේ දී

iii. අත නැවීමේ දී හා දිග හැරීමේදී ඉහත ආකාරයට පේශි සංකෝචනය වන බව ආදර්ශනය කිරීමට සකස් කළ හැකි ඇටවුමක නම් කළ රූප සටහනක් අඳින්න. (ල.02)

B සතුන් මෙන්ම ශාක ද චලන දක්වයි.

i. පහත විස්තර කර ඇති චලන ආකාර හඳුන්වන නම ලියන්න.
   a. ප්‍රතිචාරයේ දිශාව උත්තේජයේ දිශාව හා සෘජු සම්බන්ධතාවක් දක්වයි. වර්ධක ද්‍රව්‍ය වල බලපෑම නිසා සිදුවේ. (ල.01)
   b. ප්‍රතිචාරය සඳහා උත්තේජය බලපාන නමුත් උත්තේජයේ දිශාවෙහි බලපෑමක් නැත. චලනය ඊට නියමිත දිශාවකට සිදුවේ. (ල.01)

ii. නිදිකුම්බා පත්‍රයක් අතින් ඇල්ලූ විට හැකිලේ. මෙම චලනය කුමන වර්ගයට අයත් වේ ද? (ල.01)
iii. ජීවියෙකු ජීවත්වන පරිසරයේ සිටිය දී ම සංරක්ෂණය කිරීම කෙසේ හඳුන්වනු ලබයි ද? (ල.01)
iv. ශාක ජීවත්වන පරිසරයේ සිටිය දී ම සංරක්ෂණය කිරීම සඳහා යොදා ගෙන ඇති ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න. (ල.01)
(ල. 11)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පිළිතුරු පත්‍රය - I කොටස

(01)	1	(02)	4	(03)	3	(04)	2	(05)	2	(06)	1	(07)	2	(08)	3	(09)	3	(10)	3	(11)	2
(12)	1	(13)	4	(14)	4	(15)	2	(16)	4	(17)	3	(18)	4	(19)	3	(20)	1				

II කොටස

01. A (i) භූමිතෙල් - බල්බය නොදැල්වේ (ල. 01)
ලුණු ද්‍රාවණය - බල්බය දැල්වේ (ල. 01)
(ii) විද්‍යුත් විච්ඡේද්‍ය - ලුණු ද්‍රාවණය, ආම්ලිකෘත ජලය සහ කොපර් සල්ෆේට් ද්‍රාවණය (ද්‍රාවණ තුනම ලියා ඇත්නම් පමණක්) (ල. 01)
විද්‍යුත් අවිච්ඡේද්‍ය - භූමිතෙල් (ල. 01)
(iii) B (ල. 01)
(iv) විදුලිය ගමන් කිරීම (ල. 01)
ද්‍රාවණය / ද්‍රවය සමග ප්‍රතික්‍රියා නොකිරීම (ල. 01)
(v) A - ද්‍රාවණයෙහි ගිලුන කොටස රතු දුඹුරු පාට වේ. (ල. 01)
B - වායු බුබුළු පිටවේ (ල. 01)
ද්‍රාවණයෙහි වර්ණය අඩුවේ (ල. 01)
(vi) සෝඩියම් / ඇලුමිනියම් (ල. 01)
සෝඩියම් හයිඩ්රොක්සයිඩ් (ල. 01)
(vii) a. තඹ ලෝහයේ කැබැල්ලක් (ල. 01)
යකඩ ඇණය (ල. 01)
b. කොපර් සල්ෆේට් කොපර් ක්ලෝරයිඩ් / කොපර් ලෝහයේ ලවණ ද්‍රාවණයක් (ල. 01)
c. 1.5 V කෝෂය (ල. 01)

02. A (i) කර්ණ සංඛය (ල. 01)
(ii) අර්ධ චක්‍රාකාර නාළ (ල .01)
(iii) කර්ණ පටහ පටලය දෙපැත්තේ පීඩන සමානව තබා ගැනීම (ල. 02)
(iv) 20 Hz සිට 20 000 Hz දක්වා (ල. 01)
- කන තුළට බාහිර ද්‍රව්‍ය ඇතුළු කිරීමෙන් වැළකීම.
- අධික ශබ්ද වලට කන නිරාවරණය නොකිරීම
- වෛද්‍ය උපදෙස් අනුව පමණක් කනට ඖෂධ දැමීම.

(v)
- ආරක්ෂක උපාංග භාවිතයෙන් තොරව ගැඹුරු දියේ කිමිදීමෙන් වැළකීම (ගැඹුරු දියේ පීඩනය අධික බැවින්)
- කනට හෝ කන ආසන්නයට පහර දීම හෝ කන් පෙත්තෙන් ඇදීම නොකිරීම. වැනි නිවැරදි එක් කරුණක් සඳහා (ල .01)

B. (i) ගොම / පිදුරු / මුළුතැන් ගෙයින් බැහැර කෙරෙන ආහාර කොටස් වැනි නිවැරදි පිළිතුරක් සඳහා (ල. 01)
(ii) බැක්ටීරියා / නිර්වායු බැක්ටීරියා (ල. 01)
(iii) මෙතේන් / CH_4 (ල. 01)
(iv) කාබන් / C (ල. 01)
හයිඩ්‍රජන් / H (ල. 01)
(v) කාබනික පොහොර ලබා ගැනීමට හැකිවීම / අපද්‍රව්‍ය කළමණාකරණය කළ හැකි වීම. (ල. 01)

03. A (i) දකුණු කර්ණිකාව, දකුණු කෝෂිකාව, වම් කර්ණිකාව හා වම් කෝෂිකාව
කුටීර හතරම ලියා ඇත්නම් (ල. 02)
කුටීර දෙකක් හෝ තුනක් නිවැරදි නම් (ල. 01)
(ii) ද්විතුණ්ඩ කපාටය (ල. 01)
(iii) උත්තර මහා ශිරාව, අධර මහා ශිරාව, පුප්ඵුසීය මහා ධමනිය / වම් පුප්ඵුසීය ධමනිය හා පුප්ඵුසීය ශිරා / වම් පුප්ඵුසීය ශිරා රුධිර නාළ හතරම නිවැරදි නම් (ල. 02)
නාළ දෙකක් හෝ තුනක් නිවැරදිව දක්වා ඇති නම් (ල. 01)
එක් පිළිතුරක් නිවැරදි නම් ලකුණු නැත.
(iv) a. E
b. A / C / F යන ඒවායින් එකක් සඳහා (ල. 01)
(v) අඩසඳ කපාට (ල. 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

B (i)



A හා AB නිවැරදි නම් පමණක් (ල. 01)
B හා AB නිවැරදි නම් පමණක් (ල. 01)

(ii) A; B; AB හා O / A Rh; B Rh; AB Rh; හා O Rh; රුධිර ගණ හතරම නිවැරදිව ලියා ඇත්නම් පමණක් (ල. 01)

04. A. (i) විශේෂ මැවුම් වාදය, ස්වයං සිද්ධ ජනන වාදය, කොස්මොසොයික් වාදය හා ජෛව රසායනික පරිණාමය පිළිබඳ වාදය යන ඒවායින් එක් මතයක් සඳහා (ල.01) බැගින් (ල. 02)

(ii) පොසිල / සංසන්දනාත්මක ව්‍යුහ විද්‍යාව / භූගෝලීය සත්ත්ව ව්‍යාප්තිය යන ඒවායින් එක් පිළිතුරක් සඳහා (ල.01) බැගින් (ල. 02)

(iii) ජීවමාන පොසිල / සජීවී පොසිල (ල.01)

B. (i) පරිසර දූෂණය අවම වීම/ විනෝදාස්වාදය/ පර්යේෂණ කටයුතු සඳහා / අධ්‍යයනය සඳහා / ජල මූලාශ්‍ර ආරක්ෂා වීමට, දේශගුණික සාධක නියතව පවත්වා ගැනීමට වැනි කරුණක් සඳහා (ල. 01)

(ii) ස්වාභාවික ක්‍රියාවලි (ල. 01)
මානව ක්‍රියාකාරකම් (ල. 01)

(iii) a. ජීවී - අජීවී (ල. 01)
b. අජීවී - අජීවී (ල. 01)
c. ජීවී - ජීවී (ල. 01)

05. A. (i) A - ප්‍රෝටෝන (ල. 01)
B - ඉලෙක්ට්‍රෝන (ල. 01)
C - නියුට්‍රෝන (ල. 01)
(ල. 03)

(ii) A හා C (පිළිතුරු දෙකම නිවැරදි නම් පමණක්) (ල. 01)

(iii) B / ඉලෙක්ට්‍රෝන (ල. 01)

(iv) 12 (ල. 01)

B (i) කෘෂිකාර්මික (ල. 01)
කාර්මික (ල. 01)
ජනාවාස (ල. 01)

(ii) සිංහරාජය / කන්නෙලිය / දෙදියගල / නාකියාදෙණිය වන සංකීර්ණය වැනි පිළිතුරක් (ල. 01)

(iii) ගංගා (ල. 01)

06. A (i) a - ව්‍යාජපාද b - ජෛශීමය පාදය c - පියාපත් / පාද (තටු සඳහා ලකුණු නැත)
d - තටු (පියාපත් සඳහා ලකුණු නැත) (ල. 02)
පිළිතුරු හතරම නිවැරදි නම් (ල. 02) පිළිතුරු දෙකක් හෝ තුනක් නිවැරදි නම් (ල. 01) එක් පිළිතුරක් නිවැරදි නම් ලකුණු නැත.)

(ii) a - Q b - P (ල. 01)

(iii) පෙළපොතේ 91 පිටුවේ ක්‍රියාකාරකම 8. 2 සඳහන් රූපය හෝ වෙනත් නිර්මාණාත්මක ඇටවුමක රූපයක් ඇඳීමට (ල. 01)
කොටස් දෙකක් වත් ලකුණු කර ඇත්නම් (ල. 01)

B (i) a - ආවර්තී චලන (ල. 01)
b - සන්නමන චලන (ල. 01)

(ii) ස්පර්ශ සන්නමන (ල. 01)

(iii) ස්ථානීය සංරක්ෂණය (ල. 01)

(iv) රක්ෂිත දූඩි රක්ෂිත පරිසර සංවේදී කලාප (ලෙස නම් කිරීම) (ල. 01) (ල. 11)

(i) කොටස සඳහා $2 \times 20 = 40$ (ii) කොටස සඳහා $16 + 11 + 11 + 11 = 60$

මෙම පිළිතුරු පත්‍රයේ සඳහන් නොවුවද ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුර නිවැරදි නම් ලකුණු ප්‍රදානය කරන්න.